# 2025.07.08 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව
# මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

සහභාගීත්වය :-

- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
- ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා
- ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා
- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා
- ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය
- ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මුණසිංහ මහතා
- ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා
- ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා
- ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා
- ගරු මන්ත්‍රී ටී.එම්.ජගත් චමින්ද කුමාර මහතා
- ගරු මන්ත්‍රී යූ.ජී.දිමේන්ත්‍ර රංගනාත් මහතා
- ගරු මන්ත්‍රී ආර්.ජේ.ලයනල් මහතා
- ගරු මන්ත්‍රී හෂිත සුබෝදන මාරතුඩුවගේ මහතා
- ගරු මන්ත්‍රී පී.ජී.බසින්දාා පුෂ්පමාලි මිය
- ගරු මන්ත්‍රී සමල්ෂා උෂාදි විජේවික්‍රම මෙය
- ගරු මන්ත්‍රී දිල්කා හන්සිකා අබේසුන්දර මෙය
- ගරු මන්ත්‍රී ජේ.එල්.සුමිත් මහතා
- ගරු මන්ත්‍රී නිහාල් අබේවික්‍රමසිංහ මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2025 ජුලි මස මාසික සභා රැස්වීම 2025.07.08 වන දින ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව 9.30ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ කරන ලදී.

ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා පෙ.ව 9.35ට සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

## 01. පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

2025.ජුනි මස 13 දින පැවති මහා සභාවේ වාර්තාව සම්මත කිරීම.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

## 02. සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන

- මාතර දිස්ත්‍රික් විශේෂ සම්බන්ධීකරණ කමිටු රැස්වීම 2025.07.11 වන දින ප.ව 2.00ට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට නියමිත බව ඔබගේ දැනගැනීම පිණිස ප්‍රකාශ කරනවා.

- ප්‍රජා සංවර්ධන අංශය හා පුස්තකාලය එක්ව සංවිධානය කරනු ලබන බැති ගී සරණිය වැඩසටහන ජුලි මස 10 වන පොහෝ දින පැවැත්වීමට කටයුතු සූදානම් කරලා තියනවා.ඒ සඳහා සියලුම මන්ත්‍රීවරුන්ට ආරාධනා පත්‍ර ලබා දෙනවා.සියලුම දෙනා ඒ සඳහා සහභාගීවන්න ඒ වාගේම සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය පෙ.ව 9.50ට සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

## 03. සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම

**ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා**

- දොළමුල්ල මාර්ගය සංවර්ධනය කිරීම මැයෙන් දොළමුල්ල ප්‍රදේශවාසීන් විසින් ලිපියක් මඟින් ඉල්ලීමක් කරලා තියනවා.මේ පාරේ ගෙවල් 6ක් තියනවා.ඒ 6ටම යන්න පාරක් නෑ.අවස්ථා කිහිපයකදී දැනුම් දුන්නත් එය ඉටු නොවීම හේතුවෙන් ප්‍රදේශවාසීන් නැවත ලිපියක් මඟින් ඉල්ලීමක් කරලා තියනවා.
- හොරගොඩ භාග්‍යගම සර්වොදය මූල්‍ය ආයතනයට කාර්යාලයක් නොමැති බව සඳහන් කරලා ලිපියක් ලබා දීලා තියනවා.සභාවේ ඉඩමක් තියනවා සමූපකාරය ළඟ කැළෑ වෙලා.ඒ ඉඩමෙන් කොටසක් කාර්යාලය ඉදි කරන්න ලබා දෙන්න කියලා ඔවුන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී පී.ජී.බසින්දා පුෂ්පමාලි මිය**

- වැල්ලතොට පාර පලවෙනි පටුමගේ මීටර් 100ක් පමණ දුරින් දොඹගසක් තියනවා අනතුරුදායක තත්වයක තියෙන්නේ.සභාවටත් විදුලිබල මණ්ඩලේටත් දැනුම් දීලා තියනවා.තවම ඒ පිළිබඳව ක්‍රියාමාර්ගයක් අරගෙන නෑ.ප්‍රදේශයේ ජනතාව ඒ පිළිබඳ ලිපියකින් ඉල්ලීමක් කරලා තියනවා.

## 04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත.

## 05. යථා පරිදි කල්දී ඇති යෝජනා

**යෝජනා අංක 5:1**

අප සභාව සතු කොන්ක්‍රීට් අතරා ඇති මාර්ග වල අළුත්වැඩියා කළ යුතු ස්ථාන හඳුනාගෙන එම ස්ථාන අළුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය.

**ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා**

ගරු සභාපතිතුමනි,හොරගොඩ කොට්ඨාශයේ මාර්ග කිහිපයක ඇති තත්වය එක්ක තමයි මම මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ.හොරගොඩට ආවේනික ප්‍රශ්නයක් නෙවෙයි.බල ප්‍රදේශය තුළ බොහෝ පාරවල් වල මේ තත්වය දකින්න පුළුවන්.බිබුලගොඩ කියන කඳු සහිත කොටස තුළ වලවල් හැදිලා කිසිම වාහනයකින් උඩට යන්න බෑ.කොන්ක්‍රීට් මාර්ගයක් නිසා එය කොන්ක්‍රීට් වලින්ම ප්‍රතිසංස්කරණය කළ යුතුයි.බොහෝ මාර්ග හොඳ තත්වයේ තිබුණත් සමහර මාර්ග වල ප්‍රමිතිය පිළිබඳ අපට ගැටලුවක් තියනවා.හොරගොඩ නාපෙ රාජකීය විද්‍යාලය පැත්තට යන පාර පසුගිය කාලය පුරාම ලොකු ගැට්ටක් තිබුණා.ගමේ කීපදෙනෙක් එකතු වෙලා සිමෙන්ති කොට්ටයක විතර කොන්ක්‍රීට් අනලා ඒක ආවරණය කලා.ඒ වගේ අත්‍යවශ්‍ය තැන් අලුත්වැඩියා කිරීම තමයි මම යෝජනා කරන්නේ.සභාපතිතුමනි,අමුද්‍රව්‍ය ටික සභාවෙන් සපයලා දෙන්න පුළුවන් නම් ශ්‍රමය ගමේ මිනිස්සුන්ගෙන් සපයලා දෙන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ආර්.ජේ.ලයනල් මහතා**

සභාපතිතුමනි,මේ රජය පිහිටුවන්න කලින් ජනාධිපතිවරණයේදී කොට්ඨාශ දහයෙම මාර්ග අලුත්වැඩියා කිරීම,ඇල මාර්ග කොන්ක්‍රීට් කිරීම ආදී සියල්ල අපි සැලසුම් කරලා තියෙන්නේ.හඳුනාගත් ගැටලු රාශියක් තියනවා.ඉදිරියේදී ඒ සියල්ල පොදු තීරණයක් විදියට සිද්ධ වේවි.

**ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා**

ගරු සභාපතිතුමනි,ලයනල් මන්ත්‍රීතුමාගේ අදහස් වලින් ප්‍රකාශ වුණා කොට්ඨාශයේ මාර්ග සම්බන්ධව ගැටලු හඳුනාගෙන ඉදිරියේදී ඒ සියල්ල සැලසුම් කරල තියනවා කියලා.වත්මන් රජයට ස්තූතිවන්තවනවා ඒ පිළිබඳ අවධානය යොමු කිරීම පිළිබඳව.ඒ වගේම තමයි ඒ කාර්යන්

සඳහා ප්‍රතිපාදන ලැබෙනකොට මාස 6ක් අවුරුදක් පමණ ගතවේවි.උදය සාන්ත මන්ත්‍රීතුමා සඳහන් කරන්නේ ඒ කාරණාව නෙවෙයි.යම් පාරක යම් ස්ථානයක් කැඩිලා තියනවා නම් එවැනි ස්ථාන හඳුනා ගෙන තවදුරටත් ඒ කැඩීම වර්ධනය වීම වලක්වා ගෙන පාර ආරක්ෂා කරගමු කියන කාරණාව.උදාහරණයක් විදියට කොත්පහ පන්සල පාරේ වලක් තියනවා සිමෙන්ති කොට්ට 3කින් විතර ඒක සකස් කරන්න පුළුවන්.මේ ගැන සොයා බලා කටයුතු කිරීම වටිනා ක්‍රියාවක් බව ප්‍රකාශ කරනවා.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**

ලයනල් මන්ත්‍රීතුමාගේ අදහස වුනේ අපි ඒ පාරවල් හඳුනා ගෙන ඉදිරිපත් කරලා තියෙනවා කියන අදහස.අපි මේ වෙද්දි පාරවල් 77ක් විතර සම්බන්ධීකරණ කමිටුවේදී අනුමත කරගෙන තියනවා අලුත්වැඩියා කරන්න.ඊට අමතරව ස්ථාන විදියට හඳුනාගත් පාරවල් තියෙන්න පුළුවන්.උදාහරණ විදියට දම්පැල්ල බොකුටුගහහේන මාර්ගයේ සේවාපියස ආසන්නයේ මීටර් 50ක් පමණ ප්‍රමාණයක් සම්පූර්ණයෙන්ම කැඩිලා තියනවා.මන්ත්‍රීවරු හඳුනාගත් එවැනි ස්ථාන සභාවට දැනුම් දෙන්න.සභාව විදියට වැඩපිළිවෙලක් හදලා ඉක්මනින් මැදිහත්වීම සිදු කරන්නම්.දීර්ඝ කාලයක් එහෙම තිබුණම පොඩි මුදලක් විදයම් කරන්න තියන වැඩකට විශාල මුදලක් වියදම් කරන්න සිදුවනවා.ඒ යෝජනාව හොඳයි අපි අගේ කරනවා.

ඒ අනුව අප සභාව සතු කොන්ක්‍රීට් අතරා ඇති මාර්ග වල අළුත්වැඩියා කළ යුතු ස්ථාන හඳුනාගෙන එම ස්ථාන අළුත්වැඩියා කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:2</u>**

සභා බල ප්‍රදේශයේ සවිකර ඇති වීථි පහන් දිවා කාලයේ දැල්වී තිබීම විශාල ගැටළුවක් බැවින් වීදි පහන් සවි කර ඇති ස්ථාන වල ආසන්නයේ පදිංචිකරුට එම වීථි පහනේ වැදගත්කම ලිඛිතව දැනුම් දී වීථි පහන් නිසි නඩත්තුවකට එක් කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා

**<u>ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා</u>**

සභාපතිතුමනි,රාත්‍රී කාලයට සභාවක් විදියට දෙන්න පුළුවන් ලොකුම සේවයක් තමයි වීදි පහන් කියන්නේ.සෑම වසරකම විශාල මුදල් ප්‍රමාණයක් මේ සඳහා වියදම් කරනවා වගේම දවල් 12ටත් සමහර ස්ථාන වල වීදි පහන් දැල්වෙනවා.ඒ නිසා ලිඛිතව භාරකාරීත්වය ලබා දීලා නඩත්තු කටයුතු වලදී දැනුම් දියයුතු දුරකථන අංක සඳහන් කරලා යම් වැඩපිළිවෙලක් හදමු කියන යෝජනාව මං සභාවට ඉදිරිපත් කරනවා එමෙන්ම වීදි පහන් නඩත්තු කටයුතු සිදු කරන මහත්මයාටත් ස්තූතිවන්ත වෙමින් නිහඩවනවා ස්තූතියි.

**<u>ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා</u>**

සභාපතිතුමනි,මං දැනගන්න කැමතියි දැන් විදුලි බල මණ්ඩලයෙන් කොච්චර ප්‍රමාණයකට ගෙවනවද කියලා.කාලයක් තිස්සේ මේ සම්බන්ධව වැඩපිළිවෙලක් හදන්න උත්සාහ කරා බැරි වුණා.පුළුවන්නම් ලේකම්තුමියනි අලුතින් ඉඩම් වෙන්දේසි කරද්දි වෙන්දේසිකරුට ඒ ප්‍රදේශය ආලෝකමත් කරන්න භාර දෙන්න.අකුරුගොඩ ශාන්තිවත්ත ඉස්සරහට යද්දි වම්පැත්තේ තියන ඉඩම වෙන්දේසි කරන්න සූදානමක් තියනවා.ඒකේ පර්චස් 40ක් අපිට අහිමි වෙලා තියනවා.අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසමට ගියාම නිහාල් කියන මහත්තයෙක් අපිට කිව්වා ඒ ඉඩම විකුණන අවස්ථාවක ඒ ඉඩම් ප්‍රමාණය අපිට ලබා දෙනවා කියන කාරණාව. විදුලිබල මණ්ඩලයේ පාරිභෝගික පනතට අනුව යම් ප්‍රදේශයක් ජනාකීර්ණ වීමත් සමඟ පලාත් පාලන ආයතනයට ගෙවීමක් කරන්න ඕන.හරිනම් ට්‍රාන්ස්පෝමර් එකේ විදුලි ධාරාවත් වැඩි කරන්න ඕන.ගෙවල් වලට එන විදුලිය පවා අඩුවෙලා නිවෙස් වල විදුලි බල්බ පවා ඉක්මනින් අක්‍රීය වීමට හේතුවක් වෙලා තියනවා.

**<u>ගරු මන්ත්‍රී ආර්.ජේ.ලයනල් මහතා</u>**
සභාපතිතුමනි,මන්ත්‍රීතුමා හොඳ යෝජනා 2ක් ඉදිරිපත් කළේ.අපිට පුළුවන්නම් ඉදිරියේදී සෝලා විදුලි පහන් යොදා ගන්න එහිදී ඔබතුමා සඳහන් කළ ගැටලුව එන්නෙ නෑ.ඉදිරියේදී සෝලා විදුලි පහන් මිලදී ගැනීමත් ප්‍රාදේශීය සභාවට විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගැනීමත් සුදුසයි කියලා මම හිතනවා.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**
ඉදිරිපත් වූ කාරණා සලකා බැලුවම මිනිස්සු විදුලි පහනක් දා ගන්න තියන උනන්දුව ඒක දා ගත්තට පස්සෙ නෑ.ඒක මිනිස් ස්වභාවය ඒ නිසා ලියුමක් දීපු පමණින් ප්‍රශ්නය විසදෙයි කියලා හිතන්න අමාරුයි.අවශ්‍ය නැති ස්ථාන වලින් අයින් කරලා අවශ්‍ය තැන් වලට වීදි පහන් සවි කරන්න කියලා මං උපදෙස් දීලා තියෙන්නේ.අලුතින් වීදි පහන් සවි කරන්න විදියක් නෑ විදුලි බල මණ්ඩලෙන් ගණනය කිරීම් කරලා තියෙන්නේ.ඒකට බිල හදලා එවලා තියනවා ගෙවීම් කරන්න ගියොත් ඉතා විශාල මුදලක් ගෙවන්න සිදුවනවා.E සභා ඇප් එක තියනවා ඒක මිනිස්සුන්ට හුරු කලා නම් තොරතුරු ටික ඉක්මණින් ගන්න පුළුවන් වගේම ඉක්මනින් විසදුම් වලට යන්නත් පුළුවන්.ලියුම් කිහිපයක් යවමු මන්ත්‍රීතුමා ඒක සේවාවක් නිසා නීත්‍යානුකූල පැත්ත බලන්නත් ඕන.හැගීමකින් කරන්න ඕන වැඩක් ඒක මිනිසුන්ගේ ආකල්ප වල වෙනසක් ඇති විය යුතුයි.ඒ නිසා ඉවත් කළ යුතු තැන් වලින් ඉවත් කළාම තමයි ඒක දැනෙන්නේ.සෝලා විදීපහන් ඉතාම හොඳ යෝජනාවක්.මිල ටිකක් අධිකයි.සමහර ස්ථාන වල විදුලි කණු නොමැති වීම නිසා වීදි පහන් අවශ්‍යතාවය තිබුණත් සවි කරන්න විදියක් නෑ.ඒකටත් හොඳ විසඳුමක් සෝලා වීදි පහන්.දිස්ත්‍රික්ක මට්ටමින් සාකච්ජාවක් යනවා සමාගමක් එක්ක අඩු මිලට සෝලා වීදි පහන් මිලදී ගන්න.ඉදිරියේදී මුදල් ටිකක් වෙන් කරගෙන ඒ පිළිබඳ අවධානය යොමු කරනවා.අපේ සභාවේ අඩුපාඩු බොහෝමයක් තියනවා උදාහරණයක් විදියට ආපදා අවස්ථාවකදී ගහක් කඩා වැටුණොත් ඉවත් කරන්න විදුලි කියතක් අපේ සභාවේ නෑ.සභාවේ අඩුපාඩු සහිත ලේඛණයක් සකස් කරගෙන යනවා ඒකට විදුලි ජනක යන්ත්‍රයත් ඇතුලත් කරලා තියනවා.

ඒ අනුව සභා බල ප්‍රදේශයේ සවිකර ඇති වීපී පහන් දිවා කාලයේ දැල්වී තිබීම විශාල ගැටළුවක් බැවින් වීදි පහන් සවි කර ඇති ස්ථාන වල ආසන්නයේ පදිංචිකරුට එම වීපී පහනේ වැදගත්කම ලිඛිතව දැනුම් දී වීපී පහන් නිසි නඩත්තුවකට එක් කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:3</u>**
මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ වැඩ ආරම්භ කර නතර කරන ලද පහත සඳහන් මාර්ග සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

- අකුරුගොඩ උතුර ගල්ඇන්දකුට්ටිය ප්‍රධාන මාර්ගය
- තෙලිජ්ජවිල සමරසිංහාරාම මාර්ගය
- නුගදූව කොස්ඉන්දුව මාර්ගය
- දම්පැල්ල කද්දූව පාරේ කැකුණවෙල මංසන්ධියේ සිට බෙරුවෙළ හිගත්ත හරහා පරදූව මාර්ගය
- අකුරුගොඩ ගමගේවත්ත මාර්ගය
- අකුරුගොඩ පරණවත්තහේන මාර්ග පද්ධතිය
- අකුරුගොඩ රෝස්වුඩ් මාර්ග පද්ධතිය
- තෙලිජ්ජවිල ගුණසේකර මාවත
- මාලිම්බඩ ගුණසේකර මාවත

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**

ගරු සභාපතිතුමනි,මේ යෝජනාව කරන්නේ පසුගිය කලේ මාර්ග මැනුම් කටයුතු කරලා වැඩ කටයුතු ආරම්භ කරපු පාරවල් වල 10% හෝ 20% මුදලක් කොන්ත්‍රාත් සමාගම් විසින් ගත්තා.මාලිම්බඩ සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති අබේවික්‍රම මැතිතුමාට ස්තූතිවන්තවනවා මේ පිළිබඳ සොයා බලන්න අදාළ නිළධාරීන්ට යොමු කිරීම සම්බන්ධව.ඒ වගේමයි පසුගිය සභාවේ කතා බහට ලක්වුණු මාලිම්බඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සඳහා ඉඩම මිලදී ගැනීම් කටයුතු අබේවික්‍රම මැතිතුමාත් සභාපතිතුමාත් හා රාජ්‍ය නිලධාරීන් මැදිහත් වෙලා කටයුතු කරන ආකාරය බැලුවම ප්‍රදේශයේ ජනතාවගේ අපේක්ෂා ඉටුවනවා දකින්න කැමති කෙනෙක් විදියට එදා මං ගෙදර ගියේ ඉතාම සතුටින්.ඔබතුමාගෙන් මං ඉල්ලීමක් කරනවා මේ නවක මන්ත්‍රීවරුන්ටත් සම්බන්ධීකරණ කමිටුවට සහභාගීවන්න අවස්ථාවක් ලබා දෙන්න කියලා.මේ සඳහන් කල පාරවල් වලට අමතරව තව පාරවලි 2ක් තියනවා හොරගොඩ සයිකාදූපිටිය පාර හා පාතේගම පාර.එදා කමිටුවේදී ඔබතුමාගෙන් කියවුණා RDA එකෙන් එහි වැඩ ආරම්භ කරන්න සූදානම් කියලා.පොල්අරඹගොඩ හරහා හොරගොඩ පොල්පිටිය පාර වැඩ ආරම්භ කරලා නිසා මේ යෝජනාවට ඇතුළත් කලේ නැහැ.තෙලිජ්ජවිල ගුණසේකර මාවත වැඩ ආරම්භ කරලා තියනවා නමුත් එහි බෝක්කුවක් හා පැති බැම්මක් තියනවා ඒ නිසා මං ඒ පාර එකතු කළා.තව සුල්තානාගොඩ කොස්අරඹගොඩ පාර.ගරු මන්ත්‍රීතුමා මට ඒක එකතු කරන්න බැරි වෙලා තියනවා.කිරිමණ්ඩල පාරත් ඇතුළත් කරන්න.කොට්ඨාශය තුළ මේ පාරවල් පිළිබඳ කොන්ත්රාත් සමාගමෙන් විමසීමට පූර්ණ අයිතිය තියනවා.47 වෙනි පැකේජය යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය මැද්දවත්ත ඔෆිස් එකේ මහානාම මහත්තයා මේ පාරවල් බැලුවේ.ඒ පිළිබඳ මැදිහත් වෙන්න කියලා සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා</u>**

ගරු සභාපතිතුමනි පාලිත මන්ත්‍රීතුමා සඳහන් කරන යෝජනාව අනුව වැඩ ආරම්භ කර නතර කරන ලද කියන කාරණාව සම්බන්ධ කියන එක ගැන අපිට පැහැදිලි කිරීමක් අවශ්‍යයි.අපිට ඒ පිළිබඳ දැනුවත්භාවයක් නොමැති නිසා.එතුමා ඉදිරිපත් කල මාර්ග සංවර්ධනය විය යුතුයි.ගුණසේකර මාවතේ වතුර එක් රැස් වන ස්ථානයක් තිබුණා එහි අවිධිමත් විදියට බෝක්කුවක් යොදලා තිබුණ නිසා.සභාපතිතුමාගේ මැදිහත් වීමෙන් එය ප්‍රතිසංස්කරණය කරලා දුන්නා.වල්පිට පාරෙත් ස්ථාන දෙක තුනක කැඩිලා තියනවා ඒවත් ඉක්මනින් නිවැරදි කරන්න පුළුවන්වම් හොඳයි.මාර්ග සංවර්ධන අධිකාරිය හරහා සම්බන්ධ වීම අධ්‍යයනයකින් පසු සොයා බලමු.ගුණසේකර මාවතේ පැති බැම්ම සඳහා සභාව හරහා මැදිහත් වන්න යෝජනාවක් විදියට මං ඉදිරිපත් කරනවා.ස්තූතියි.

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**

ගරු සභාපතිතුමනි,මේ පාරවල් සියල්ලම කාපට් කරපු පාරවල්.මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ ගිවිසුම් අත්සන් කරලා තිබුණේ.ඒ ආයතනය මඟින් පාරෙ වැඩ සිද්ධ වෙන්නෙ නැති නිසා පාරේ යන්නත් අපහසු නිසා සපුගිය කාලේ ලේකම්තුමිය මැදිහත් වෙලා ගුණසේකර මාවතේ මුල් ටික හැදුවා.පරගහවත්ත සිට ඉස්කෝලේ මහත්තගෙ නිවස ළඟට කැටගල් ඇල්లුවා.එතන තිබුණා බෝක්කුවක්.ඒකෙන් තමයි බිසෝ දොළින්,සමරසිංහාරාම වැවෙන්,තෙලිජ්ජවිල බිබුලෙන් එන ලොකු වතුර කඳ යන්නේ.එහි පැති බැම්ම හිටපු මැතිවරණ කොමසාරිස්තුමියගේ නිවස සිට කළුආරච්චි මහත්තගේ ගේ ළඟට එනකන් දාලා තියනවා.නමුත් එතනින් ඉස්සරහට එන්නේ.ත්‍රීමා විතාන මහත්මියගේ ගේ ළඟ ඉඳලා කුඹුස්ස ගලවලා ඒ වතුර ටික බස්සන්න සලස්වලා තියනවා.තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලයට විශාල සිසුන් සංඛ්‍යාවක් යන නිසා ඒ බෝක්කුව පළල් කරලා ආරක්ෂිත වැටක් ගහන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා</u>**

සභාපතිතුමනි,පාලිත මන්ත්‍රීතුමාගේ යෝජනාවේ සඳහන් නොවුනු පාරවල් දෙකක් තමයි හොරගොඩ පාතේගම පාර හා හොරගොඩ පොල්පිටිය එකමුතු මාවත.මේ පාරවල් දෙකම සභාවේ පාරවල් මේ දෙකේම පැතිබැම් සියල්ල RDA එකේ කොන්ත්‍රාත්කරුවො විසින් වැඩ

අවසන් කරලා තියනවා.ABC දාලා කාපට් දාන මට්ටමට තිබුණු පාරක් දැන් හොඳටම අබලන් වෙලා.අපි මේ ගැන දැනුවත් නෑ කොපමණ මුදලක් ගෙවන්න තියනවද ගෙවල තියනවද කියලා ඒ ගැන RDA එකෙන් විමසලා තොරතුරු ලබා ගමු.මේ පාරවල් දෙකත් සභාව මැදිහත් වෙලා ඉක්මනින් කටයුතු නිම කරගන්න ඉල්ලීමක් කරමින් නිහඬවනවා.

**<u>ගරු මන්ත්‍රී ආර්.ජේ.ලයනල් මහතා</u>**
සභාපතිතුමනි,මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් වැඩ නතර කරපු පාරවල් අතරට අයත් වනවා ආදම්වත්ත මාර්ගයත්.මේ මාර්ග සියල්ලම 20% ගත්තා.මාලිම්බඩ ඕගස්ප ගුණසේකර මාවතට තොළපොත මාර්ගය කියලත් කියනවා.අනිත් පැත්තෙන් සමගි මාවතට සම්බන්ධ වෙන්නෙ.ඒක විකල්ප මාර්ගයක්.සම්පූර්ණ අබලන් තත්වයේ තියෙන්නේ.එමෙන්ම නුගදූව කොස්ඉන්දූව මාර්ගයත් ඒ විදියමයි.මුල කොටස කොන්ක්‍රීට් කරලා තියනවා දෙපැත්ත මීටර් 265ක් කරලා නෑ.මේ මාර්ගය අධිවේගී මාර්ගයට,මාතර අකුරැස්ස ප්‍රධාන මාර්ගයට පිවිසිය හැකි පාලටුව ගුණරතන විද්‍යාලයට දරුවන්ට පහසුවෙන් ළගා විය හැකි මාර්ගයක්.ගල්පමුණ ප්‍රදේශය ගංවතුරෙන් යට වුණෝතින් අතුරු විකල්ප මාර්ගයක් විදියට භාවිතා කරන්න කොස්ඉන්දුව මාර්ගය වැඩ යෝජනා වලට අපි ඉදිරිපත් කරලා තියනවා.ආදම්වත්ත ඉහලම තියනවා උළුපට්ටල්දෙණිය වැව කියලා වැවක්.ඉතාම දර්ශනීය ස්ථානයක්.මේ මාර්ගය ඒ හරහා සකස් කර ගත්තොත් දේශීය විදේශීය සංචාරකයින්ට දැකුම්කළු ස්ථානයක් වේවි.එම නිසා මේ මාර්ගයත් ඇතුළත් කරන්න කියලා මං ඉල්ලා සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී නිහාල් අබේවික්‍රමසිංහ මහතා</u>**
සභාපතිතුමනි,RDA එකෙන් අතරමඟ නතර කරපු මාර්ග අතරට මාරගොඩ පූර්වාරාම විහාරයට යන පාරත් තියනවා.ප්‍රධාන මාර්ගයෙන් හා කැකුණවෙළ හරහා පාරවල් දෙකක් තියනවා.ඒ වගේම සභාපතිතුමාගේ නිවස පැත්තට යන මාර්ගයත් කානු පද්ධතිය හදලා ඉක්මනින් වැඩ අවසන් කරන්න කියන ඉල්ලීම කරනවා.ස්තූතියි.

**<u>ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා</u>**
සභාපතිතුමනි,ගැමුණු මාවතේ ජීවත් වන ජනතාව ඉල්ලීමක් කලා ගැමුණු මාවත කිරිමණ්ඩලගෙවත්ත අසල පාරේ කානු පද්ධතිය ඉදි කිරීම අතරමඟ නතර වෙලා තියනවා කියලා.ඒ ප්‍රදේශයේ ජනතාවත් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා ඒක සම්පූර්ණ කරලා දෙන්න කියලා.

**<u>ගරු මන්ත්‍රී ජේ.එල්.සුමිත් මහතා</u>**
ගරු සභාපතිතුමනි,ඇල්ගිරිය බිබුලකඩේ පිටිවිලහේන පාරත් එවැනිම මාර්ගයක් දැනට ගමන් කිරීමට ඉතාම අපහසු මට්ටමක තියෙන්නේ.ඒ පාරත් ප්‍රතිසංස්කරණය කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**
මන්ත්‍රීවරුනි,ඒ කියපු කාරණා සම්බන්ධව සොයා බලා අදහසක් ගන්න පුළුවන් ඉදි කරපු පාරවල්,භාගෙට ඉදි කරපු පාරවල් හා මුදල් ගෙවීම් සිදුවෙලා තියන ආකාරය පිළිබඳව හා මුදල් තියනවා නම් අපිට ගන්න පුළුවන්ද RDA එකෙන් හදා ගන්න පුළුවන්ද කියන එක සභාව පැත්තෙන් මැදිහත් වීමක් කරමු.පිටිවිලහේන පාර මේකෙම එකක්ද කියන එක දැනගන්න පුළුවන් විමසීමක් සිදු කලාට පස්සෙ.ගුණසේකර මාවතේ හුගක් වැඩ අවසන් කරල තියනවා.කොට්ඨාශ මන්ත්‍රීතුමා ස්ථාන 3ක් හදුනාගෙන තිබුණා ඉක්මණින් මැදිහත් වියයුතු කාරනා විදියට.එකක් පැති බැම්ම අනික වතුර හිරවෙන බෝක්කු දෙකක් තියනවා.තාක්ෂණ නිලධාරි මැදිහත් වෙලා බෝක්කු 2ට ඇස්තමේන්තු හදලා තියනවා.ඒක සභාවට කරන්න පුළුවන් වේවි ඉස්සරහට.නිහාල් මන්ත්‍රීතුමාගේ කාරණාව ගත්තම අපි හදුනා ගත් පාරවල් හැත්තෑ ගානට අයිතියි ඒ පාරත්.ඉදිරියේදී ඒ කටයුතු සියල්ල කඩිනමින් ඉටු කරන්න පුළුවන් වේවි.

ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ වැඩ ආරම්භ කර නතර කරන ලද ඉහත සඳහන් මාර්ග සංවර්ධනය කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**6. යථා පරිදි කල් දී නොමැති යෝජනා.**

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**

**<u>යෝජනා අංක 6:1</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු ඉඩම් පොල් වගාව හා කුරුඳු වගාව සඳහා යෙදවීමේ ව්‍යාපෘතිය අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු ඉඩම් පොල් වගාව හා කුරුඳු වගාව සඳහා යෙදවීමේ ව්‍යාපෘතිය අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:2</u>**

2025 - බිම් මල් වගාව සම්බන්ධ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු ව්‍යාපෘතිය අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

ඒ අනුව 2025 - බිම් මල් වගාව සම්බන්ධ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු ව්‍යාපෘතිය අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:3</u>**

2025.06.23 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිලිබඳ කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා

ඒ අනුව 2025.06.23 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිලිබඳ කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:4</u>**

2025.06.23 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී නිහාල් අබේවික්‍රමසිංහ මහතා

ඒ අනුව 2025.06.23 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:5</u>**

2025.07.04 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා

ඒ අනුව 2025.07.04 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:6</u>**

2025.06.17 දින පැවති කාර්මික සේවා කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යොජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා

මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීම

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

ඉහත යෝජනාව

ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

ඒ අනුව 2025.06.17 දින පැවති කාර්මික සේවා කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:7</u>**

252-6517 කැබ් රථය සඳහා AC කම්ප්‍රෙෂර් එකක් යෙදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා

ඒ අනුව 252-6517 කැබ් රථය සඳහා AC කම්ප්‍රෙෂර් එකක් යෙදීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**7) කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම. - නැත**

**8) ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම**

. 2025 ජුනි මස ආදායම් වියදම් වාර්තාව ඉදිරිපත් කරන ලදී.

**9) වෙනත් කරුණු - නැත**

සභාපතිතුමාගේ ස්තූති කථාවෙන් පසු පෙ.ව 11.30 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව